# තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
# වෘත්තීය දැනුම ඇගයීමේ පරීක්ෂාව 2021 මාර්තු/ අප්‍රේල්
# කේශාලංකරණ ශිල්පී -ජාතික වෘත්තීය සුදුසුකම
# 4 වන මට්ටම

**කාලය -පැය 03**

## විභාග අපේක්ෂකයන් හට උපදෙස්

- මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි බහුවරණ ප්‍රශ්න මෙන්ම කෙටි පිළිතුරු ප්‍රශ්න ද ඇතුලත් වේ.
- ප්‍රශ්ණ පත්‍රය 1හා 2වශයෙන් කොටස් 2කි.
- 1 කොටසෙහි සෑම ප්‍රශ්ණයකදීම දී ඇති පිළිතුරු හතර අතුරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඊට අදාළ අංකය අයත් කොටුව තුළ කතිරය (×) සලකුණු කරන්න.
- 2 කොටසෙහි සෑම ප්‍රශ්ණයකටම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්ණ පත්‍රයෙහි පිටු 12ක් අඩංගු වේ.

---

**1 කොටස**

1. ඇමයිනෝ අම්ල එකට එකතු වී සාදන රසායනික බන්ධන හැඳින්වෙන්නේ,
   a. හයිඩ්‍රජන් බන්ධන
   b. පෙප්ටයිඩ් බන්ධන
   c. ඩයිසල්ෆයිඩ් බන්ධන
   d. තියො බන්ධන

2. පාරිභෝගික සේවාව යනු කුමක්ද?
   a. නිෂ්පාදන හා සේවාවන් මිලදී ගැනීමට හා භාවිතා කිරීමට අවශ්‍ය සහය සහ උපදෙස් ලබාදීම
   b. කොණ්ඩා මෝස්තර සහ තෝරාගත් නිෂ්පාදන තෝරා ගැනීමට සහය සහ උපදෙස් ලබාදීම
   c. හිසකෙස් සත්කාරක නිශ්පාදන තෝරා ගැනීමට පමණක් සහයවීම
   d. කොණ්ඩා මෝස්තර තෝරා ගැනීමට සහයවීම

3. කොණ්ඩා මෝස්තර නිෂ්පාදන නිර්දේශ කිරීමේදී සලකා බැලියයුතු වැදගත් සාධකයක් වන්නේ,
   a. හිසකෙස්වල තත්ත්වය
   b. මුහුනේ හැඩය
   c. සුදු හිසකෙස් ප්‍රතිශතය
   d. ස්වභාවික හිසකෙස්වල වර්ණ මට්ටම

4. දැවෙන සුළු රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීමට වඩාත් සුදුසු වන්නේ,
   a. සිසිල් ස්ථානයක්
   b. වැසිය හැකි කැබිනට්ටුවක්
   c. විවෘත ප්‍රදේශයක්
   d. සේදුම් ස්ථානයක්

5. හිසකෙස් සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීමට පෙර,
   a. PPE පත්‍රය විශ්ලේෂණය කරන්න
   b. අනතුරුදායකබව හෝ භයානකබව හඳුනා ගන්න
   c. සැලෝන් හිමිකරුගෙන් විමසන්න
   d. නිෂ්පාදන උපදෙස් කියවන්න

6. Hair wig එකක් සවි කිරීමට භාවිතා කරන මෙවලම් මොනවාද?
   a. රබර් පටි සහ ටේප් එක
   b. Hair clips සහ රබර් පටි
   c. Tail comb සහ රබර් පටි
   d. Tail comb සහ Hair clips

7. පහත වර්ග අතුරින් හිසකෙස් වර්ණය ඉස්මතු කරවීමේ හැකියාව ඇති හිසකෙස් වර්ණකය වන්නේ,
   a. Permanent වර්ණක
   b. Semi- permanent වර්ණක
   c. Demi- permanent වර්ණක
   d. Temporary වර්ණක

8. හෙනා කොණ්ඩය වර්ණවත් කරන්නේ,
   a. මෙඩියුලා ආවරණය වීමෙන්
   b. කෙස් කද ආවරණය වීමෙන්
   c. කියුටිකල් තුලට කා වැදීමෙන්
   d. කොටෙක්ස් තුලට කා වැදීමෙන්

9. ෂැම්පු කිරීමට සූදානම් වීමේදී ගත යුතු පළමු පියවර වන්නේ,
   a. හිස්කබල සම්බාහනය කිරීම
   b. සේවාදායකයාගේ හිසකෙස් සහ හිස්කබල පරීක්ෂා කිරීම
   c. තාපය හා උත්තේජකයක් යෙදීම
   d. ජලය කාන්දු නොවන කේප් එකක් සේවාදායකයාට පැළඳවීම

10. ඉතා දිගු කෙස් සඳහා සුදුසු ස්ථිර රැල්ලක් ඔතා ගැනීමේ ක්‍රමයක් වන්නේ,
   a. ඩබල් ටූල් ක්‍රමය (Double tool method)
   b. සිංගල් හැලෝ ක්‍රමය (Single halo method)
   c. ස්ට්‍රේට් බැක් ක්‍රමය (Straight back method)
   d. ඩබල් හැලෝ ක්‍රමය (Double halo method)

11. සතුටුදායක සේවාවක් සදහා, රූපලාවණ්‍යාගාරයට හොද ජලනල හා ප්‍රමාණවත් ........................ අත්‍යාවශ්‍ය වේ.
    a. වාතාශ්‍රය
    b. ආලෝකය
    c. වාහන නැවැත්වීමේ පහසුකම්
    d. ප්‍රථමාධාර

12. ඇසිඩ් බැලන්ස් (Acid balance) හා ස්වභාවික ස්ථිර රැලි ගැන්වීමේ දියර නිපදවන්නේ,
    a. ගැඹුරු සහ ඉතා තද රැළි ගැන්වීමක්
    b. කුඩා සර්පිලාකාර රැළි ගැන්වීමක්
    c. මෘදු, ස්වභාවික පෙනුමක් ඇති රැළි ගැන්වීමක්
    d. කෙටි කල් පවතින රැළි ගැන්වීමක්

13. "RIDDOR" යනු කුමක්ද?
    a. Risk of injury diseases
    b. Reporting of injuries, diseases and dangerous occurrences regulations
    c. Reporting information on diseases and dangerous occurrences risk
    d. Risk of injuries, diseases and dangerous occurrences regulations

14. සැලෝන් උපකරණ පිළිබද තොරතුරු සොයා ගැනීමේ ක්‍රමය වන්නේ පහත සදහන් ඒවායින් කුමක්ද?
    a. සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබද අත්පොත මගින්
    b. නිෂ්පාදකයාගේ අත්පොතෙන් හෝ තාක්ෂණික දත්ත මගින්
    c. ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු සමග සාකච්ඡා කිරීම මගින්
    d. උපකරණයේ මූලාරම්භක සැපයුම්කරු සම්බන්ධ කර ගැනීමෙන්

15. ජලය සමන්විත වනුයේ,
    a. හයිඩ්‍රජන් අණු 2ක් සහ ඔක්සිජන් අණු 1ක්
    b. හයිඩ්‍රජන් අණු 2ක් සහ ඔක්සිජන් අණු 2ක්
    c. හයිඩ්‍රජන් අණු 1ක් සහ ඔක්සිජන් අණු 1ක්
    d. හයිඩ්‍රජන් අණු 1ක් සහ ඔක්සිජන් අණු 1ක්

16. හිසකෙස් relax කිරීමේදී රසායනික ද්‍රව්‍ය ක්‍රියාකාරී වේලාවට බලපාන සාධකය වන්නේ,
    a. සේවාදායකයාගේ වයස
    b. Hair filler
    c. හිසකෙස් වර්ණය
    d. කෙස් ගසෙහි සිදුරු (Porosity)

17. හිසකෙස් relax කිරීමෙන් පසු භාවිතා කිරීමට වඩාත් සුදුසු ෂැම්පු වර්ගය වන්නේ,
    a. ඔගනික් (organic)
    b. නොන් ඇල්කලයින් (non alkaline)
    c. ටොනින් (toning)
    d. ඇල්කලයින් (alkaline)

18. Solid form ක්‍රමයට කට් එකක් සිදුකිරීමේදී අනුගමනය කල යුතු නිවැරදි ඉරියව්ව කුමක්ද
    a. අතිලෙහි සිට අත්ල දක්වා
    b. ඇඟිලි තුඩු සිට
    c. අත්ල උඩු අතට
    d. අත්ල පහළට

19. හිසකෙස් කපන අතරතුර තුවායක් වෙනුවට ආදේශකයක් ලෙස භාවිතා කරනු ලබන්නේ,
    a. පනාව
    b. රෙදි කේප් එකක්
    c. ප්ලාස්ටික් කේප් එකක්
    d. නෙක් ස්ට්‍රිප් (neck strip)

20. කෙස් රොදක් රැළි ගැන්වීමේදී එහි රටාව කෙස්ගසෙහි .......................... අනුව සිදුවේ.
    a. ඇදෙන සුළු බව
    b. චලනය
    c. ස්වභාවය
    d. කෙස් ගසෙහි උරා ගැනීමේ ශක්තිය

21. හිසකෙස් එහි හැඩය, ප්‍රමාණය සහ දිශාව ලබාගන්නේ එහි,
    a. කෝටෙක්ස් මගිනි
    b. කියුටිකල් මගිනි
    c. මෙඩියුලා මගිනි
    d. ෆොලිකල් මගිනි

22. හොද හිටගැනීමේ ඉරියව්වක් සදහා, හිස ඉහළට තබා ගන්න, නිකට පොළොවට සමාන්තරව තබා ගන්න, පපුව ඉහළට සිටින සේ තබා, උරහිස් ලිහිල් කරන්න, සහ
    a. පහළ උදරය පිටතට දමන්න
    b. දණහිස් එකට සිටින සේ තබා ගන්න
    c. පහළ උදරය ඇතුළට දමන්න
    d. දෙපතුළ ඈත් කොට තබන්න

23. පැතජනික් (Pathajounic) බැක්ටීරියා විසින්,
    a. අපිරිසිදු සෞඛ්‍ය ඇතිකරයි
    b. වාසිදායක බලපෑම් ඇතිකරයි
    c. රෝග ඇතිකරයි
    d. ප්‍රතිඔක්සිකාරක ඇතිකරයි

24. සාමාන්‍යයෙන් මෙඩියුලා අඩංගු වන්නේ කුමන ආකාරයේ හිසකෙස් වලද?
    a. ස්වභාවිකවම බ්ලොන්ඩ් හිසකෙස්වලට
    b. රසායනිකව ප්‍රතිකාර කරන ලද හිසකෙස්වල
    c. ඉතා සිනිදු හිසකෙස්වල
    d. ඝන, රළු හිසකෙස්වල

25. හිසකෙස්වල සමස්ත ශක්තියෙන් තුනෙන් එකක් පිහිටා ඇත්තේ,
   a. සෝල්ට් බන්ධන තුල
   b. රසායනික බන්ධනය තුල
   c. සල්ෆර් බන්ධනය තුල
   d. පැපිල බන්ධන තුල

26. හිස්කබලේ වටකුරු පැල්ලම් ලෙස හිසකෙස් නැතිවීම හදුන්වන්නේ,
   a. ඇලෝපසියා ටෝටල්ස් ලෙස (Alopecia Totals)
   b. ඇලෝපසියා ආරේටා ලෙස (Alopecia Areata)
   c. ඇන්ඩ්‍රොජනික් ඇලෝපසියා ලෙස (Androcentric Alopecia)
   d. සෙබස් ඇලෝපසියා ලෙස (Sebaceous Alopecia)

27. සුදු හිසකෙස් හැදින්වීම සදහා භාවිතා කරන තාක්ෂණික යෙදුම වන්නේ,
   a. ඇල්බිනෝ
   b. කැනිටීස්
   c. ප්‍රීමැචුවර්
   d. ජෙනටික්ස්

28. දත්ත ආරක්ෂණ පනත සමග කටයුතු කිරීමේදී ගත යුතු වැදගත්ම පියවර කුමක්ද?
   a. සියලුම දත්ත සටහන් කිරීම
   b. විස්තර සෑම කෙනෙකුටම ලබාගැනීමට හැකිසේ තිබීම
   c. දත්ත දැකිය හැක්කේ කාටදැයි සේවාදායකයා එකගවීම
   d. සියලුම සේවාදායකයින්ගේ තොරතුරු වාර්තා කරගැනීම

29. ස්ථිර හිසකෙස් වර්ණකයක PH අගය වනුයේ,
   a. 6.5 – 7.5
   b. 8.5 – 9.5
   c. 7.5 – 8.5
   d. 9.5 – 10.5

30. උස පෙනුමක් ඇති කිරීම සදහා කොණ්ඩය කැපිය යුත්තේ කෙසේද
   a. නේප් ඒරියා සහ ක්‍රවුන් ඒරියා පිරිපුන් ආකාරයට (Full at nape and cram)
   b. නේප් ඒරියා සහ ක්‍රවුන් ඒරියා අඩු පිරිපුන් ආකාරයට (Close at nape and crown)
   c. ඉදිරිපස කෙටිවනසේ හා පිටුපස දිගු වනසේ (Short in front, longer in back)
   d. නේප් ඒරියා අඩු පිරිපුන් බවක් සිටිනසේ (Close at nape)

(ලකුණු 1 × 30 = 30)

## 2 කොටස

1.

1.1 හිසකෙස් විශ්ලේෂණය කළ හැකි ක්‍රම 4ක් ලියන්න. (ලකුණු 02)

1.2 මෙලනින් යනු කුමක්ද යන්න විස්තර කර එහි ප්‍රභේදයන් නම් කරන්න (ලකුණු 03)

1.3 හිස්සොරි ඇති කරන තත්වයන් 4ක් ලියන්න (ලකුණු 02)

1.4 පෙඩිකියුලසිස් කැපිටිස් (Pediculosis capitis) හැඳින්වෙන පොදු නාමය කුමක්ද? මෙවැනි තත්ත්වයන්හීදී කේශාලංකරණ ශිල්පියෙකු විසින් ගත යුතු පියවර විස්තර කරන්න. (ලකුණු 03)

2. PH වගුවක් ඇද ඒමත පහත සදහන් ද්‍රව්‍ය ඒවායේ PH අගය අනුව ස්ථානගත කරන්න

a. නියුට්‍රලයිසර් (neutralizer)
b. පිරිසිදු ජලය (pure water)
c. ශැම්පු (shampoo)
d. වර්ණ සේදුම්කාරක (color rinses)
e. ස්ට්‍රේට්නින්ග් ක්‍රීම් (hair straighteners)
f. ඇසිඩ් බැලන්ස් පර්මින් ලෝශන් (acid balance perm lotion)
g. ඇල්කලයින් පර්මින් ලෝශන් (alkaline perm lotion)
h. හිසකෙස් (hair/ skin)
i. ලයිට්නර් (lighteners)
j. කන්ඩිශනර් (conditioner)

(ලකුණු 10)

3.

3.1 පහත සදහන් හිසකෙස් වල ඇති ගුණාංග විස්තර කරන්න (ලකුණු 05)

a. කෙස්ගසේ ඇදෙන සුළු භාවය

b. කෙස්ගසේ උරාගැනීමේ හැකියාව

c. කෙස්ගසේ ඝනත්වය

d. කෙස්ගසේ ස්වභාවය

e. කෙස්ගසේ තත්ත්වය

3.2 කොණ්ඩා කැපුමකට පෙර සැලකිලිමත් විය යුතු ප්‍රධාන සාධක හතර මොනවාද? (ලකුණු 05)

4.

4.1 ඇනලින් ඩිරව්වේටිව් (aniline derivative tints) වර්ණකයන් පහසුවෙන්ම කොටෙක්ස් (cortex) ස්ථරයට ඇතුලත් වන්නේ ඇයි ද යන්න විස්තර කරන්න. (ලකුණු 2.5)

4.2 කොටෙක්ස් ස්ථරය තුලට හිසකෙස් වර්ණක සහ ඩිවලොපර් ඇතුළු වූ විට සිදුවන්නේ කුමක්ද? (ලකුණු 2.5)

4.3 ඇනිලින් ඩිටර්වටිව් (aniline derivative) වර්ණකයන් ස්ථිර වන්නේ ඇයි? (ලකුණු 2.5)

4.4 Highlighting ක්‍රම දෙකක් විස්තර කරන්න (ලකුණු 2.5)

5.

5.1 කේශලාවන්‍යාගාරයක් අසාර්ථක වීමට හේතු 4ක් නම් කර විස්තර කරන්න. (ලකුණු 04)

5.2 කේශලාවන්‍යාගාරයක් තුල සිදුවන පහත අනතුරු සඳහා සිදුකල යුතු ප්‍රථමාධාර විස්තර කරන්න. (ලකුණු 06)

a. පර්මින් ලෝෂන් ස්වල්පයක් ඇස තුලට ඇතුලත් වීම

b. කොණ්ඩා කැපුමකදී ශිල්පියාගේ ඇඟිල්ල කැපීම

c. තාප පිළිස්සුමක් සිදු වීම

6.

6.1 සේවාදායකයාගේ ආරක්‍ෂාව හා පරිස්සම පිළිබඳව අවධාරණය කරමින් වැඩ කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2.5)

6.2 කේශාලංකරණ ශිල්පියා සංස්කෘතික වෙනස්කම් පිළිබදව අවබෝධයක් ඇති කර ගැනීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 2.5)

6.3 කේශාලංකරණ ශිල්පියාගේ සනීපාරක්ෂාව හා බාහිර පෙනුම වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න (ලකුණු 2.5)

6.4 ඔබ සේවාදායකයෙකු සමග වැඩ කරමින් සිටියදී ඔබගේ කේශලාවන්‍යාගාරයෙහි ගිනි අනතුරු ඇඟවීම් සංඥා නිකුත් වුවහොත් ඔබ ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 2.5)

7.

7.1 කෙස් ගසෙහි ප්‍රධාන අංග දෙක කුමක්ද? ඒවා පිළිබදව වෙන වෙනම විස්තර කරන්න.
(ලකුණු 05)

7.2 පහත සදහන් හිසකෙස් වර්ග සදහා සුදුසු ෂැම්පු තෝරා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න
(ලකුණු 05)

a. තෙල් සහිත හිසකෙස්

b. වියළි හිසකෙස්

c. හානී වූ කෙස් කළඹක්

d. රසායනික ප්‍රතිකාර කරන ලද හිසකෙස්

e. හිස්සොරි සහිත කෙස් කළඹක් සහ හිස් කබලක්